සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

14.02.2024

Learning Resource Centre
De Mazenod College
Kandana
60368

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)
ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)
Year End Evaluation - 2023 (2024)

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 09 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: I, II | කාලය / காலம் / Time: පැය 2 යි |

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ........................

සැලකිය යුතුයි.

- I කොටසේ ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු ලියන්න.
- I කොටසේ අදාල පිළිතුරු වෙනම කඩදාසියක ලියා පළමු කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාරදෙන්න.

## I - කොටස

01. ඉන්දියානු සාගරයේ තම වෙළෙඳ බලය ගොඩනැගීමේ දී ලන්දේසීන්ට සටන් කිරීමට සිදු වූයේ කුමන යුරෝපා ජාතිය සමඟ ද?
1. බ්‍රිතාන්‍ය 2. ප්‍රංශ 3. ස්පාඤ්ඤ 4. පෘතුගීසි

02. ක්‍රි.ව. 1602 දී ශ්‍රී ලංකාවට පැමිණි ජොරිස් වැන් - ස්පිල්බර්ජන් නම් ලන්දේසි ජාතිකයා හමු වූ උඩරට පාලකයා කවුරුන් ද?
1. පළමුවන විමලධර්මසූරිය රජු 2. දෙවන විමලධර්මසූරිය රජු
3. සේනා සම්මත වික්‍රමබාහු රජු 4. ශ්‍රී විජය රාජසිංහ රජු

03. ක්‍රි.ව. 1766 දී තමන්ට වාසිදායක කොන්දේසි මාලාවක් ඉදිරිපත් කරමින් උඩරට පාලකයා සමඟ ගිවිසුමකට එළඹි ලන්දේසි ආණ්ඩුකාරවරයා කවුරුන් ද?
1. බැරන් වැන් එක් 2. කලන් අල්බස් 3. විලෙම් පැල්ක් 4. ජෙරාඩ් හල්ෆ්ට්

04. බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ වෙරළබඩ ප්‍රදේශ වල වෙළෙඳ හා පරිපාලන කටයුතු වෙන් වෙන් නිලධාරීන් යටතේ සිදුවිය යුතු බව යෝජනා ඉදිරිපත් කළ කොමිසම කුමක් ද?
1. කෲව් මැකලම් 2. ද මියුරන් 3. කැමරන් 4. මැනිං

05. ක්‍රි.ව. 1803 දී උඩරට ආක්‍රමණය කළ ඉංග්‍රීසීන් උඩරට රජු හැටියට ප්‍රකාශයට පත් කළ කුමාරයා කවුරුන්ද?
1. කන්නසාමි කුමරු 2. මහා අස්ථාන කුමරු
3. මුත්තුසාමි කුමරු 4. කුණ්ඩසාලේ කුමරු

06. උඩරට රජු හා එහි ජනතාව අතර යහපත් සබඳතාවක් පවතින තාක් එම රාජධානිය ආක්‍රමණය කිරීමෙන් සාර්ථක ප්‍රතිඵල නෙලාගත නොහැකි බව දන, ඒ සඳහා උපායශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කළ ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා වන්නේ,
1. තෝමස් මේට්ලන්ඩ් ය. 2. රොබට් බ්‍රවුන්රිග් ය.
3. පෙඩ්රික් නෝර්ත් ය. 4. ෆන් එංගල් බෙක් ය.

07. බ්‍රිතාන්‍ය පාලනය යටතේ මෙරට රජයේ ආදායම වැඩිකර ගැනීම සඳහා කෝල්බෲක් කොමිසම ඉදිරිපත් කළ යෝජනාවක් පහත පිළිතුරු අතරින් තෝරන්න.
1. උඩරට හා පහතරට ඒකාබද්ධ කොට පාලනය කිරීම.
2. රජයේ ඉඩම් විකිණීමේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම.
3. ඇතැම් දෙපාර්තමේන්තු වසා දැමීම.
4. සිවිල් සේවක සංඛ්‍යාව අඩු කිරීම.

08. බ්‍රිතාන්‍ය පාලන සමයේ මෙරට ක්‍රියාත්මක වූ මිෂනාරීන් ස්වකීය ආගම පැතිරවීමට ගත් ක්‍රියාමාර්ගයක් නො වන්නේ මින් කුමක් ද?

1. ලේඛන හා දේශන මාධ්‍ය යොදා ගැනීම.
2. දේශීය සංස්කෘතිය පිළිබඳ අවධානය යොමු කිරීම.
3. රාජ්‍ය අනුග්‍රහය ලබා ගැනීම.
4. සමාජ සේවා කටයුතු

09. අනුරාධපුරයේ නටබුන් ව ගිය බෞද්ධ පූජනීය ස්ථාන ආරක්ෂා කර ගැනීමේ ව්‍යාපාරයක් ආරම්භ කළ පුද්ගලයා කවුරුන් ද?

1. පියදාස සිරිසේන මහතා
2. ජේම්ස් පීරිස් මහතා
3. වලිසිංහ හරිස්චන්ද්‍ර මහතා
4. විජයානන්ද දහනායක මහතා

10. ඉන්දියානු නිදහස් සටන් ව්‍යාපාරයේ දී මුස්ලිම් ජනතාව වෙනුවෙන් පකිස්ථානය යනුවෙන් වෙනම රටක් පිහිටුවා ගැනීමේ ප්‍රබල ව්‍යාපාරයක් ගෙන ගිය පුද්ගලයා කවුරුන් ද?

1. මවුලානා අබුකලාම් අසාද්
2. රාම් මෝහන් රෝයි
3. ලාල් ලජ්පත් රායි
4. මොහොමඩ් අලි ජින්නා

11. ඉංග්‍රීසින් ඉන්දියාවට පැමිණෙන විට ශක්තිමත්ව පැවති මුගල් අධිරාජ්‍යයේ පාලකයා කවුරුන් ද?

1. බාබුර්
2. මහා අක්බාර්
3. ජහන්ගීර්
4. ෂා ජහන්

12. ඉන්දියාවට පැමිණි යුරෝපා ජාතීන් පිහිටුවා ගත් වෙළෙඳ මධ්‍යස්ථාන නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

| | | |
|---|---|---|
| පෘතුගීසීන් | A | මද්‍රාසිය |
| ලන්දේසීන් | B | චන්ද්‍රනගර් |
| බ්‍රිතාන්‍ය | C | ඔරිස්සා |
| ප්‍රංශ | D | ගෝව |

1. DCAB
2. ACDB
3. BCAD
4. DBCA

13. ශ්‍රී ලාංකිකයින් දේශපාලන බලතල ලබා ගැනීමේ අරමුණෙන් ශක්තිමත් උද්ඝෝෂණ ව්‍යාපාරයක් දියත් කිරීමට පිහිටුවාගත් සංවිධානය කුමක් ද?

1. හලාවත සංගමය
2. ලංකා ජාතික සංගමය
3. ලංකා සංගමය
4. යාපනය සංගමය

14.
- රජයේ ආදායම් මාර්ග හා වියදම් කටයුතු
- අධිකරණ කටයුතු

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ ඉහත ක්ෂේත්‍ර පිළිබඳ සොයාබලා නිර්දේශ ඉදිරිපත් කිරීමට පත් කළ කොමිසම කුමක් ද?

1. මැනිං ඩෙවොන්ෂයර්
2. මැකලම්
3. සෝල්බරි
4. කෝල්බෲක්

15. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ රටේ ආරක්ෂාව, මුදල් හා නීති කටයුතු පවරාදෙනු ලැබුවේ කවුරුන් යටතට ද?

1. කතානායක වරයාට
2. ආණ්ඩුකාර වරයාට
3. රාජ්‍ය නිලධාරීන්ට
4. කාරක සභා සභාපති වරුන්ට

16. 1978 දී නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හඳුන්වාදීමට කටයුතු කළ නායකයා කවුරුන් ද?

1. ජේ. ආර්. ජයවර්ධන මහතා
2. එස්. ඩබ්ලිව්. ආර්.ඩී. බණ්ඩාරනායක මහතා
3. සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මහතා
4. ජෝන් කොතලාවල මහතා

17. ක්‍රි. ව. 1953 පැවති හර්තාල් ව්‍යාපාරය නිසා ඉල්ලා අස් වූ අගමැතිවරයා කවුරුන් ද?

1. සී. බී. ද සිල්වා මහතා
2. ඩඩ්ලි සේනානායක මහතා
3. ඒ අමිර්තලිංගම් මහතා
4. ඒ. එස්. මොලමුරේ මහතා

18. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානියා වශයෙන් කටයුතු කරන්නේ මින් කවුරුන් ද?

1. අගමැතිවරයා
2. ආණ්ඩුකාරවරයා
3. අග්‍ර විනිශ්චකාරවරයා
4. ජනාධිපතිවරයා

19. මෙරට ප්‍රථම කාර්මික ජනපදය පිහිටුවනු ලැබුවේ කුමන ස්ථානයක ද?

1. කොග්ගල
2. කටුනායක
3. ඒකල
4. රත්මලාන

20. ශ්‍රී ලංකාවේ ඉහළම අධිකරණය මෙන්ම අවසාන අභියාචනාධිකරණය වන්නේ,

1. ශ්‍රේෂ්ඨාධිකරණය යි.
2. මහේස්ත්‍රාත් අධිකරණය යි.
3. දිසා අධිකරණය යි.
4. මහාධිකරණය යි.

(ලකුණු $20 \times 2 = 40$)


## II - කොටස

- පළමුවන ප්‍රශ්නය අනිවාර්යය වේ.
- අනෙකුත් ප්‍රශ්න අතුරින් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

---

1) පහත **A** හා **B** යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයන කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


**A**



අ) 1) 'A' රූපයෙන් දක්වෙන ජලාශය නම් කරන්න.
2) මෙය ඉදිකළේ කුමන සංවර්ධන යෝජනා ක්‍රමයක් යටතේ ද?
3) මෙවැනි ජලාශ ඉදිකිරීමෙන් බලාපොරොත්තු වූ අරමුණු දෙකක් ලියන්න.

(ලකුණු 4 × 2 = 8)

**B**



ආ) 1) මෙම පුද්ගලයා කවුරුන් ද?
2) එතුමාගේ මුල් නාමය සඳහන් කරන්න.
3) මෙතුමා පැවිදි බවට පත් වූයේ කිනම් නමකින් ද?
4) මෙතුමාගෙන් සිදු වූ එක් සේවාවක් සඳහන් කරන්න.

(ලකුණු 4 × 2 = 8)

2) i. ඉංග්‍රීසීන්ට ත්‍රිකුණාමලය වරාය වැදගත්වීමට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

ii. පහත තොරතුරු හා සම්බන්ධ පුද්ගලයින් අනුපිළිවෙළින් ලියා දක්වන්න.
A - ක්‍රි. ව. 1803 උඩරට ආක්‍රමණය කළ සෙන්පතියා
B - උඩරට තොරතුරු සෙවීමට පත් කළ සිවිල් නිලධාරියා
C - ක්‍රි. ව. 1762 උඩරට රජු හමු වූ ඉංග්‍රීසි දූතයා
D - වෙරළබඩ ප්‍රදේශවල බදු අය කිරීමට ගෙන්වාගත් මදුරාසි නිලධාරීන් (ලකුණු 4)

iii. ඉංග්‍රීසීන්ට උඩරට රාජධානිය කෙරේ අවධානය යොමු කිරීමට බලපෑ හේතු දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5)

3) i. 1818 නිදහස් සටනේ නායකයන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 2)

ii. 1848 නිදහස් සටන ඇතිවීමට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 4)

iii. ක්‍රි. ව. 1850 න් පසු මෙරට පාලනය කළ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරු දේශීය කෘෂිකර්මය නගා සිටුවීමට ගත් ක්‍රියාමාර්ග දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5)

4) i. මෙරට ධර්ම දූත කටයුතුවල නිරත වූ මිෂනාරි සංවිධාන දෙකක් නම් කරන්න. (ලකුණු 2)

ii. පහත තොරතුරු හා සම්බන්ධ පුද්ගලයින් අනුපිළිවෙලින් ලියන්න.
A - බෞද්ධ ප්‍රවෘත්තීන් ඇතුළත් නාට්‍ය රචනා කිරීම -
B - තරුණ බෞද්ධ සංගමයේ ප්‍රථම සභාපති වීම -
C - මෙරට බෞද්ධ පාසල් පිහිටුවීමට පුරෝගාමී වීම -
D - මාළිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන පිහිටුවීම - (ලකුණු 4)

iii. මෙරට හින්දු හා ඉස්ලාම් පුනර්ජීවනයට කටයුතු කළ එක් නායකයෙකු බැගින් සඳහන් කොට කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5)

5) i. ක්‍රි. ව. 1857 ඉන්දියාවේ ඇති වූ සිපොයි කැරැල්ලට ආසන්න හේතුව ලියන්න. (ලකුණු 2)

ii. ඉන්දියානු ජාතික සංගමය තුළ සිටි මතවාදී කණ්ඩායම් දෙක නම් කරන්න. (ලකුණු 4)

iii. ඉන්දියානු නිදහස් සටනේ කැපී පෙනෙන නායකයෙකු ලෙස මහත්මා ගාන්ධිතුමාගේ කටයුතු කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 5)

6) i. පංච මහා බලවේග වලින් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

ii. ව්‍යවස්ථාදායකය හෙවත් නීති සම්පාදනය කරන ආයතන පහත නම් වලින් හැඳින්වූයේ කුමන ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ වල දැයි පිළිවෙලින් ලියන්න.

A - රාජ්‍ය මන්ත්‍රණ සභාව -

B - ජාතික රාජ්‍ය සභාව -

(ලකුණු 4)

iii. ක්‍රි. ව. 1947 හඳුන්වා දෙනු ලැබූ සෝල්බරි ප්‍රතිසංස්කරණ වල විශේෂ ලක්ෂණ දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 5)

7) i. පහත සඳහන් තොරතුරු හා සම්බන්ධ පුද්ගලයින් ලියා දක්වන්න.

A - මෙරට ප්‍රථම ජනාධිපතිවරයා -

B - 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව හඳුන්වාදුන් නායිකාව - (ලකුණු 2)

ii. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්නට ලැබෙන මූලික මිනිස් අයිතිවාසිකම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 4)

iii. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ඇති වූ කාර්මික දියුණුව කරුණු දෙකක් යටතේ විස්තර කරන්න. (ලකුණු 5)